**ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2018**

-------------------------------------------------------

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------------

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත | | | |
| (i) 35(ආ) වගන්තිය | ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම ජාතික උපදේශක කමිටුවේ (National Advisory Committee) කාර්යයක් වන නමුත්, ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණි. | ජාතික ඖෂධ ප්‍රතිපත්තිය පිළියෙල කිරීම ප්‍රතිපත්තිමය කාරණාවක් වන බව හා එය ඖෂධ නියාමන අධිකාරියේ විෂය පථයට අදාළ කටයුත්තක් නොවන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 41(2), 66(2) හා 87(2) වගන්ති | වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන (Medicine Regulatory) අංශයේ, වෛද්‍ය උපකරණ නියාමන (Medicine | නව බඳවා ගැනීම් පිළිබඳව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමඟ සාකච්ඡාකර මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | Devices Regulatory) අංශයේ හා සීමාස්ථ නිෂ්පාදන නියාමන (Border Line Production Regulatory) අංශයේ ප්‍රධානියා ලෙස පත්කර නොතිබුණි. | | |
| | (iii) 61, 84(2), 85, 103(2),104 වගන්ති | ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ ඖෂධ, ලියාපදිංචි කළ හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ගැසට්කර මහජනතාවට දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. | 2019 ඔක්තෝබර් 09 දිනැති අංක 2144/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් අධිකාරිය විසින් ලියාපදිංචි කරන ලද ඖෂධ ඇතුළත් නියමයන් ප්‍රකාශයට පත්කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iv) 123 වගන්තිය | පනත ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අභියාචනා කමිටුව පත්කළ යුතු බව අමාත්‍යවරයා දැනුවත්කර ඇති බව. | -එම- |
| (ආ) | 2005 අංක 06 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත | 2018 වර්ෂයේ තෙවන හා හතරවන කාර්තුවලට අදාළ එකතු කළ අගය මත බදු රු.93,058,701 ක් පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබුණි. | සේවක හිඟකම නිසා එකතුකළ අගය මත බදු නියමිත දිනට ගෙවිය නොහැකි වූ බව හා මේ වන විට 2018 තෙවන හා හතරවන කාර්තු වලට අදාළ එකතුකළ අගය මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර ඇති බව. | පනත ප්‍රකාරව, එකතුකළ අගය මත බදු නියමිත දිනට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | 2018 වර්ෂයේ තෙවන හා හතරවන කාර්තුවලට අදාළ මුද්දර ගාස්තු රු.20,482,266 ක් පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබුණි. | සේවක හිඟකම නිසා මුද්දර ගාස්තු නියමිත දිනට ගෙවිය නොහැකි වූ බව හා මේ වන විට 2018 තෙවන හා හතරවන කාර්තු වලට අදාළව මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර ඇති බව. | පනත ප්‍රකාරව, මුද්දර ගාස්තු නියමිත දිනට ප්‍රේෂණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395 (ඈ) | එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙළ කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2019 ජුනි 12 දින වන විටත් 2018 නොවැම්බර් සිට 2019 මැයි මාසය දක්වා වූ මාස 07 සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි. | සේවක හිඟකම නිසා බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කළ නොහැකි වූ බව, නමුත් මේ වන විට 2019 මැයි 21 දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඇති බව, ඉතිරි දින සඳහා කඩිනමින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාර්ෂිකව විගණන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, 2017 හා 2018 වර්ෂවලදී විගණන කමිටු රැස්වීම් 02 බැගින් පමණක් පවත්වා තිබුණි. 2019 වර්ෂය සඳහා මෙම වාර්තාවේ දිනය වන විට රැස්වීම් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් චක්‍රලේඛයෙන් හඳුන්වාදී තිබුණු ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන බව හා අදාළ ආකෘති සහිත ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය මඟින් හඳුන්වාදී තිබුණු ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, ජාතික උපදේශක කමිටුව, ඖෂධ ඇගයීම් කමිටුව, වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව, සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටුව හා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය බලාත්මක කිරීම සඳහා නියෝග පිළියෙල කර තිබුණත්, 2019 මැයි 31 දින වන විටත් එම නියෝග | කමිටු විසින් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටි සඳහන් කරමින් යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශ සහ වෙනත් මාර්ගෝපදේශ | පනත ප්‍රකාරව නියෝග නීත්‍යානුකූල කරගැනීමට හා මාර්ගෝපදේශ පිළියෙල කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නීත්‍යානුකූල කර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් එම කමිටු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි සඳහන් කරමින් යහපත් නිෂ්පාදන පරිචයන් (GMP) පිළිබඳ මාර්ගෝපදේශ හා වෙනත් මාර්ගෝපදේශ පිළියෙල කර ගැනීමට නොහැකිවී තිබුණි. | පිළියෙල කරගැනීමට අදාළ ලිපි සකස් කර ඇති බව. | |
| (ආ) | 1980 අංක 27 දරන විලවුන්, උපකරණ හා ඖෂධ ලියාපදිංචි කිරීමේ පනත අහෝසි කරමින් 2015 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත බලාත්මක කර තිබුණි. ප්‍රතිකාරක නොවන සුවඳ විලවුන් නිෂ්පාදනය හා ආනයනය සම්බන්ධයෙන් අහෝසි කරන ලද පනතේ දක්වා තිබුණු ප්‍රතිපාදනයන් නව පනතට ඇතුළත්කර නොතිබුණි. 2015 ජූලි 01 දින සිට ප්‍රමාණය හා වටිනාකම නිශ්චය කළ නොහැකිවූ සුවඳ විලවුන් නිෂ්පාදන රට තුළට ආනයනය කර තිබුණු නමුත් ඉහතින් සඳහන් පරිදි නෛතික විධිවිධාන නොතිබීම හේතුවෙන් පසුගිය වර්ෂ 4 ක පමණ කාලයක් තිස්සේ එම ආනයනයන් පිළිබඳව විධිමත් නියාමනයක් සිදුව නොතිබුණි. ව්‍යාජ හා ප්‍රමිතියෙන් බාල සුවඳ විලවුන් නිෂ්පාදන රට තුළට ඇතුල්වීම හා ඒවා භාවිතයෙන් දිගුකාලීනව සිදුවිය හැකි බරපතල සෞඛ්‍ය තර්ජන පිළිබඳව කළමනාකරණය නිසි අවධානය යොමුකර නොතිබුණි. | විලවුන් නියාමනයට අදාළ විශේෂඥ කමිටුවක් මේ වන විට පත් කර ඇති අතර එම කමිටුව විසින් අදාළ සංශෝධනයන් හඳුනාගෙන ඇති බව. | ආනයනය කරන සුවඳ විලවුන් නියාමනය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත සංශෝධනය කළ යුතුය. |
| (ඇ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 58 හා 82 වගන්ති ප්‍රකාරව, කිසිදු තැනැත්තෙකු විසින් යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර සහ අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතුය. එම පනතේ 59 හා 83 වගන්ති ප්‍රකාරව, ප්‍රත්‍යක්ෂ ආරක්ෂා සහිත සහ නිවැරදි තත්ත්වයේ ඖෂධ හෝ වෛද්‍ය උපකරණ ලබාදෙන බවට සහතික වීම සඳහා ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඖෂධ හෝ වෛද්‍ය උපකරණ ඇගයීමෙන් පසුව ලියාපදිංචි සහතික හා බලපත්‍ර නිකුත් කිරීම සිදු කළ යුතුය. ඉහත සඳහන් විධිවිධානයන්ට පටහැනිව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා අනෙකුත් රජයේ හා පෞද්ගලික ආයතන වෙනුවෙන් 2018 වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 553 | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව හා මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | පනතේ දක්වා ඇති අවශ්‍යතා සඳහා පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්ද, 2019 ජනවාරි සිට අප්‍රේල් 30 දින දක්වා එවැනි ලිපි 139 ක්ද නිකුත්කර තිබුණි. පනත යටතේ ලියාපදිංචි නොකළ ඖෂධ හා වෛද්‍ය උපකරණ ආනයනකරුවන් ඒවා ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගැනීම සඳහා එම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි භාවිතා කර තිබුණි. | | |
| (ඇ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වගන්තිය ප්‍රකාරව, ජීවිතයක් බේරා ගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ හැකිවේ. නමුත් එවැනි විශේෂිත අවශ්‍යතා ගණයට නොවැටෙන, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම, ලියාපදිංචි සැපයුම්කරුවන් ලංසු ඉදිරිපත් නොකිරීමවැනි හේතු මත සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 99 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම 07 ක් සඳහා නැවත නැවතත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අවස්ථා 19 ක් පැවතුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව හා මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | පනතේ දක්වා ඇති අවශ්‍යතා සඳහා පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ යුතුය. |
| (ඉ) | ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ කමිටුවට විශේෂඥ වෛද්‍යවරු දෙදෙනෙකු පත්කර තිබුණද බොහෝ අවස්ථාවලදී ඉන් එක් විශේෂඥ වෛද්‍යවරයකු පමණක් එම කමිටුවට සහභාගීවී තිබුණි. | මෙම කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පත් කරන ලද කමිටුවක් බව, ඒ සඳහා විශේෂඥ වෛද්‍යවරු දෙදෙනෙක් පත්කර ඇති බව හා මෙම කමිටුවේ අනුමැතිය මත පමණක් ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කරන බව. | සියළු කමිටු සාමාජිකයින් සහභාගී කරවාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත ප්‍රකාරව, ඖෂධ ලියාපදිංචි සහතිකයේ කාලසීමාව අවසන් වීමේ දිනයට මාස හයකට පෙර එම සහතිකය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කර නොතිබුණු අවස්ථාවලදී, එම ලියාපදිංචිය ස්වංක්‍රීයව අවලංගුවී ඇති ලෙස සැලකිය යුතුය. නමුත් ඊට පටහැනිව 2018 වර්ෂයේදී ඖෂධ ලියාපදිංචි සහතික නිකුත් කරන ලද අවස්ථා 19 ක් පැවති බව ලිපිගොනු 25 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. | ඖෂධ ලියාපදිංචි සහතිකයේ කාලසීමාව අවසන් වීමේ දිනයට මාස හයකට පෙර එම සහතිකය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කර නොතිබුණු අවස්ථාවලදී, එම සහතිකය අදාළ වන ඖෂධයේ ලියාපදිංචිය හෝ බලපත්‍රය ස්වයංක්‍රීයව අවලංගු වී ඇති ලෙස සලකා කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස, ඖෂධ නිෂ්පාදනය කරන පරිශ්‍රය හා නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා නොකර සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචි සහතික 16 ක් නිකුත් කර තිබුණු බව ඖෂධ ලියාපදිංචි කිරීම් 28 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. | සියළු ලියාපදිංචි සහතික සඳහා නැවත නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරනු ලබන බව හා ඉදිරි මාස 6 තුළ වාර්තා සම්පූර්ණ කිරීමට කටයුතු සැලසුම් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කළ යුතුය. |
| (ඌ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත ප්‍රකාරව, ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනයක ලියාපදිංචි සහතික නිකුත් කිරීමට පෙර ඒවායේ සාම්පලවල තත්ත්වය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙතින් පරීක්ෂා කළ යුතුය. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ සාම්පල පරීක්ෂා කිරීමකින් තොරව තාවකාලික නව ලියාපදිංචි සහතික 82 ක් හා වර්ෂ 05 ක් සඳහා නිකුත් කරනු ලබන සම්පූර්ණ නව ලියාපදිංචි සහතික 06 ක් නිකුත් කර තිබුණි. තවද ඖෂධ සාම්පල් පරීක්ෂා කිරීමකින් තොරව තාවකාලික නැවත ලියාපදිංචි සහතික 84 ක් නිකුත් කර තිබුණි. එසේම තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා සාම්පල ඉදිරිපත් කර ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රථමයෙන්, ඖෂධ 07 ක් සඳහා තාවකාලික ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී සාම්පල පරීක්ෂා කිරීමකින් තොරව වෛද්‍ය උපකරණ 198 ක් හා සීමාස්ථ නිෂ්පාදන 19 ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවූ බැවින් සාම්පල පරීක්ෂා කිරීමකින් තොරව සහතික නිකුත් කළ බව, නමුත් ඖෂධවල ප්‍රමිතිය හා තත්ත්වය සහතික කිරීම සඳහා අනෙකුත් නියාමන ආයතන පිළිගත් ආකාරයට ඖෂධ පරීක්ෂා කිරීමේ ආයතනවල වාර්තා පදනම් කර ගනිමින් මෙම ලියාපදිංචිය ලබාදී ඇති බව, ඉදිරියේදී මෙම තත්ත්වය මඟ හැරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ ධාරිතාව වැඩි කිරීමට පියවර ගෙන ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කළ යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති හා 2015 ජූලි 01 දින සිට අධිකාරිය වෙත පවරා ගත යුතුව තිබුණු ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සතුව පැවති වත්කම් 2019 මැයි 31 දින වන විටත් ගිණුම්වලට ගෙන නොතිබුණි. තවද 2015 ජූලි 01 දිනට පැවති පැවරුම් 30 ක් 2019 මැයි 31 දින වන විටත් අවසන් කර නොතිබීම හේතුවෙන් එම පැවරුම්වලට අදාළ සාම්පල් සියල්ල කල් ඉකුත්වී තිබුණි. | මේ වන විට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සතු වත්කම් ගිණුම් ගත කිරීමට අවශ්‍ය මූලික කටයුතු කරමින් පවතින බව, සාම්පල් පරීක්ෂාවන් 34 න් 03 ක් සඳහා වාර්තා නිකුත් කර ඇති බව, එක් සාම්පලයක් ආපසු ලබා දී ඇති බව හා ඉතිරි සාම්පල් මේ වනවිටත් කල් ඉකුත් වී ඇති බව. | අමාත්‍යාංශය සතු වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ සාම්පල් 1,767 ක් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර තිබුණු නමුත් ඉන් සාම්පල් 58 ක් පමණක් පරීක්ෂා කර තිබුණි. සාම්පල් පරීක්ෂා කිරීමේ ප්‍රගතිය සියයට 03 ක් පමණක් විය. | පශ්චාත් අලෙවි සමීක්ෂණ මඟින් රාජ්‍ය ආයතනවල ඇති ඖෂධවල තත්ත්වය මැනීමට අදාළ විධිවිධාන ඇතුළත් චක්‍රලේඛය අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ බව හා ඉදිරියේදී පරීක්ෂණාගාර පහසුකම් වැඩි දියුණු කළ පසු ඉලක්ක ගත සැලසුමකට අනුව කටයුතු කිරීමට බලාපොරොත්තුවන බව. | ඉදිරිපත් කරනු ලබන සියලු සාම්පල් පරීක්ෂා කිරීමට හැකි වන ලෙස රසායනාගාර ධාරිතාවය වර්ධනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඖෂධ 792 ක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉන් ඖෂධ 7 ක ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර හෝ අයදුම් පත ඉල්ලා අස්කර ගෙන හෝ තිබුණි. ඉතිරි ඖෂධ 393 ක් සඳහා පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු අතර ලියාපදිංචි සහතික නිකුත් නොකළ ඖෂධ සංඛ්‍යාව 392 ක් විය. | ඖෂධ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ දී සිදුකරනු ලබන ක්‍රියාවලිය ඉතාමත් නිවැරදිව සහ විශ්වාසවන්තව ඉටුකළ යුතු බැවින් යම්කිසි කාලයක් ඒ සඳහා ගත වන බව හා ඒ අනුව සහතික පත් නිකුත් කිරීමේ ප්‍රමාදයක් ඇති විය හැකි බව. | ලියාපදිංචිය සඳහා අයදුම්පත් භාරගැනීම හා නිකුත් කිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් ගොනුවක් විධිමත්ව හා නිවැරදිව පවත්වා ගත යුතු අතර ප්‍රමාදයකින් තොරව ලියාපදිංචි සහතික නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී වෛද්‍ය උපකරණ 758 ක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉන් වෛද්‍ය උපකරණ 16 ක ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර හෝ අයදුම් පත ඉල්ලා අස්කර ගෙන හෝ තිබුණි. ඉතිරි වෛද්‍ය උපකරණ 279 ක් සඳහා පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු අතර ලියාපදිංචි සහතික නිකුත් නොකළ වෛද්‍ය උපකරණ සංඛ්‍යාව 463 ක් විය. | වෛද්‍ය උපකරණ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ දී සිදුකරනු ලබන ක්‍රියාවලිය ඉතාමත් නිවැරදිව සහ විශ්වාසවන්තව ඉටුකළයුතු බැවින් යම්කිසි කාලයක් ඒ සඳහා ගත වන බව හා ඒ අනුව සහතික පත් නිකුත් කිරීමේ ප්‍රමාදයක් ඇති විය හැකි බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ඖෂධ හා වෛද්‍ය උපකරණ නැවත ලියාපදිංචිය සඳහා අධිකාරිය වෙත ලද අයදුම්පත් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | පරිගණක ගත ජාල ක්‍රමයක් නොපැවතීම හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව. | -එම- |
| (ඊ) | ලියාපදිංචි සහතික හා බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයට පහත සඳහන් හේතු බලපා තිබුණි.<br>(i) අයදුම්පත සමඟ ඉදිරිපත් කරන ලියවිලි සහිත ගොනුව ඇගයීම සඳහා ඖෂධවේදියකු වෙත ප්‍රමාදවී ලබාදී තිබුණි. තවද ඇගයීම ආරම්භ කිරීම සඳහා දිගු කාලයක් ගත කර තිබුණි. නියදි පරීක්ෂණයට ලක්වූ ලිපිගොනු 08 ක නියැදියක් අතරින් ලිපිගොනු 05ක ඇගයීම ආරම්භ කිරීම සඳහා මාස 09 සිට මාස 16 දක්වා අතර කාල පරාසයක් ගත කර තිබුණි.<br>(ii) ඇගයීම අවසන් කර හා ලියාපදිංචි ගාස්තු ගෙවා තිබියදී, සහතිකය නිකුත් කිරීම සඳහා මාස 02 කට අධික කාලයක් ගත කර තිබුණි.<br>(iii) ඖෂධවේදී තනතුරු 17 ක්, ඖෂධ පරීක්ෂක තනතුරු 17 ක්, ඖෂධ විශ්ලේෂක තනතුරු 07 ක් හා රසායනාගාර පරීක්ෂක තනතුරු 06 ක් පුරප්පාඩුව පැවතුණි.<br>(iv) ප්‍රමාණවත් රසායනාගාර පහසුකම් නොතිබුණි. | ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ දී සිදුකරනු ලබන ක්‍රියාවලිය ඉතාමත් නිවැරදිව සහ විශ්වාසවන්තව ඉටුකළයුතු බැවින් යම්කිසි කාලයක් ඒ සඳහා ගත වන බව හා ඒ අනුව සහතික පත් නිකුත් කිරීමේ ප්‍රමාදයක් ඇති විය හැකි බව. | අයදුම්පත් ඉදිරිපත් කළ දින සිට සහතික හා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගත කළ යුතු සම්මත කාලයක් හඳුනාගත යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද සැලැස්මකට අනුව කටයුතු කරමින් ලියාපදිංචි සහතික හා බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 119 (4) වගන්තිය ප්‍රකාරව, ඔසුසල් ලියාපදිංචියට හා බලපත්‍රයක් නිකුත් කිරීමට ගත කළ යුතු නිශ්චිත කාලසීමාවක් නිර්ණය කර නොතිබුණි. 2018 වර්ෂය තුළදී ඔසුසල් 10 ක ලියාපදිංචිය සඳහා මුදල් අයකළ දින සිට බලපත්‍ර නිකුත් කිරීමට මාස 03 සිට මාස 07 දක්වා වූ විවිධ කාලපරාසයන් ගත කර තිබුණි. තවද, ඔසුසල් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය තුළ වූ සියලු තොරතුරු ඇතුළත් කිරීම සඳහා විධිමත් දත්ත ගොනුවක් අධිකාරිය විසින් පවත්වා නොතිබුණි. | කාර්ය මණ්ඩල ඌනතා සහ බලපත්‍ර නිකුත් කිරීමේ අංශය වසර 3 ක් තුළ ස්ථාන 3 ක ස්ථානගත කිරීම හේතුවෙන් ප්‍රමාදවීම් සිදුවී ඇති බව, 2018 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක ජාලගත ක්‍රමයට බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කළ නිසා ඉදිරියේදී මෙම ගැටළුව ඇති නොවන බව. | අයදුම්පත් ඉදිරිපත් කළ දින සිට සහතික හා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගත කළ යුතු සම්මත කාලයක් හඳුනාගත යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද සැලැස්මකට අනුව කටයුතු කරමින් ලියාපදිංචි සහතික හා බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කර ගත යුතුය. අයදුම්පත් ඉදිරිපත් කිරීම හා ලියාපදිංචි සහතික නිකුත් කිරීම පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් ගොනුවක් විධිමත්ව පවත්වාගත යුතුය. |
| (ඈ) | විගණන නිලධාරීන් විසින් අධිකාරියේ ආහාර හා ඖෂධ පරීක්ෂක නිලධාරියෙකු සමඟ 2019 ජුනි 04 දින කොළඹ, කොහුවල, කළුබෝවිල හා දෙහිවල ප්‍රදේශවල පිහිටි ඔසුසල් 20 ක් පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය කළ කරුණු පහත පරිදි විය. | | |
| | (i) 1985 දෙසැම්බර් 02 දිනැති අංක 378/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 49 වන වගන්තිය හා 63 වන වගන්තිය ප්‍රකාරව, සෑම බලයලත් සිල්ලර වෙළෙන්දෙකු හා සෑම බලයලත් තොග වෙළෙන්දෙකු විසින් තමා වෙත නිකුත් කර ඇති බලපත්‍රය ඖෂධවේදී ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපතද සමඟ තමා ඖෂධ විකිණීම කරන ස්ථානයේ ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය කර තැබිය යුතුය. නමුත් ඔසුසැල් 09ක ඔසුසල් බලපත්‍රය ප්‍රදර්ශනය කර නොතිබුණි. | කාර්ය මණ්ඩල ඌනතා සහ බලපත්‍ර නිකුත් කිරීමේ අංශය වසර 03 ක් තුළ ස්ථාන 03ක ස්ථානගත කිරීම හේතුවෙන් බලපත්‍ර නිකුත් කර නොතිබුණු බව. | විධිමත්ව හා කාර්යක්ෂමව බලපත්‍ර නිකුත් කළ යුතුය. ඔසුසැල් නියාමනය විධිමත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 1992 ජූලි 06 දිනැති අංක 722/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 15 වන සංශෝධනයේ සඳහන් 43 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ඖෂධ විකිණීම කරගෙන යාමට පිළියෙල කරන ස්ථානය ප්‍රමාණවත් වූද, බලපත්‍ර නිකුත් කරනු ලැබූ ඖෂධවල ගුණත්වය ආරක්ෂා කිරීමේ පහසුකම්වලින් සමන්විත වූද ස්ථානයක් විය යුතුය. එසේම ස්ථානය ලියාපදිංචි වූ ඖෂධවේදියෙකුගේ පාලනය යටතේ තිබිය යුතුය. නමුත් පරීක්ෂණය සිදුකළ අවස්ථාවේදී එම අවශ්‍යතාවලින් සමන්විත නොවුණු ඔසුසල් පැවතුණි. තවද ලියාපදිංචි ඖෂධවේදියෙකු නොසිටි ඔසුසල් 13 ක් විය. | විගණනයෙන් පෙන්වාදී ඇති ගැටළුව නිවැරදිව හඳුනා ගෙන ඇති බව හා එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා පියවර ගෙන ඇති බව. | ඔසුසැල් නියාමනය විධිමත් කළ යුතුය. |
| (iii) 1985 දෙසැම්බර් 02 දිනැති අංක 378/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 41 හා 55 වගන්ති ප්‍රකාරව හා ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 119 (1) වගන්තිය ප්‍රකාරව, අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන කිසිම තැනැත්තෙකු විසින් ඔසුසලක් පවත්වාගෙන නොයා යුතුය. නමුත් අදාළ කාලසීමාව සඳහා වලංගු බලපත්‍රයක් නොතිබුණු ඔසුසල් 15 ක් තිබුණි. | සමහර ඔසුසැල් බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණු නමුත් කාර්ය මණ්ඩල ඌනතාවය හේතුවෙන් බලපත්‍ර නිකුත් කර නොතිබුණු බව හා අනෙකුත් ඔසුසැල් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ඔසුසැල් නියාමනය විධිමත් කළ යුතුය. |
| (iv) ඔසුසල් බලපත්‍ර ලබාගැනීම සඳහා මුදල් ගෙවා තිබුණු නමුත් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය සඳහා හා බලපත්‍ර ලබා ගැනීමකින් හා බලපත්‍ර අලුත් කර ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු සිදුකිරීම වැළැක්වීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. සමස්ථ දිවයින පුරා සිදුකළ යුතු ඖෂධ වෙළෙඳසැල් පිළිබඳ අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබුණි. | කාර්ය මණ්ඩල ඌනතාවය මේ සඳහා බලපා ඇති බව හා ජාලගත ක්‍රමය තුළ විගණනයෙන් පෙන්වාදී ඇති ගැටළු නිරාකරණය වී ඇති බව. | ඔසුසැල් නියාමනය විධිමත් කළ යුතුය. |

## 2.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය විසින් මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් රු.6,300,223 ක් වැය කර Desktop පරිගණක 16 ක්, Laptop පරිගණක 07 ක් (Microsoft office home and business 2016 version සමඟ), UPS 30 ක්, Laser Printers 19 ක්, Dot Matrix Printers 5 ක් හා Digital multifunctional photocopy machines 7 ක් මිලදීගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව, මෙම ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබීම, සම්මත ලංසු කැඳවීමේ ලේඛනය හෝ ඊට අනුගතවන ලේඛනයක් හෝ භාවිතා කර නොතිබීම, ලියාපදිංචි සැපයුම්කරුවන් 22 දෙනෙකු අතරින් සැපයුම්කරුවන් 10 දෙනෙකුගෙන් ලංසු කැඳවූ බවට සටහන් යොදා තිබුණු නමුත් එම 10 දෙනා තෝරා ගත් ආකාරය, එම 10 දෙනා කවුරුන්ද යන්න හා ඔවුන්ගෙන් ලංසු කැඳවූ ආකාරය ලිඛිත සාක්ෂි මගින් තහවුරු නොකිරීම, ලංසු ඉදිරිපත් කළ යුතු අවසන් දිනය 2017 නොවැම්බර් 20 වන බවට සටහන් යොදා තිබුණු නමුත් ලංසු කැඳවූ දිනය තහවුරු නොකිරීම, 2017 නොවැම්බර් 21 දින එනම් ලංසු කැඳවීම අවසන් වූ දිනට පසු දින ලංසු කැඳවීමේ අවසන් දිනය 2017 නොවැම්බර් 23 දින දක්වා දීර්ඝ කර ඇති බව ලංසුකරුවන් 07 දෙනෙකු වෙත පමණක් විද්‍යුත් තැපෑල මගින් දන්වා තිබීම, පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබීම, ලංසු වලංගු කාලයක් නියම කර නොතිබීම, ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කර නොතිබීම, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබීම, ප්‍රතිග්‍රහන ලිපියක් ලංසුකරු වෙත නිකුත් කර නොතිබීම, විධිමත් ගිවිසුමකට එළඹී නොතිබීම, කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබීම හා වගකීම් සහතික ලබා ගෙන නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. තවද, සපයා තිබුණු පරිගණක හා උපාංග සඳහා භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් කර නොතිබුණි. එසේම ස්ථාවර වත්කම් ලේඛනයක හා විධිමත් ඉන්වෙන්ට්‍රියක සටහන් කර නොතිබුණු අතර ඒ වෙනුවට පොදු ද්‍රව්‍ය ලේඛනයක සටහන් කර තිබුණි. මෙම පරිගණක හා උපාංග අතරින් Desktop පරිගණක 04ක් භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකෙරුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගන්නා බව, මේ වන විට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව, ලියාපදිංචි සහතික නිකුත් කිරීම සහ අදාළ වෙනත් අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා පරිගණක හා උපාංග භාවිතය අත්‍යවශ්‍ය බව, අවම නිලධාරීන් පිරිසකගේ සහ පළපුරුදු සේවකයන් නොවන ප්‍රායෝගික පුහුණුව සඳහා බඳවාගත් නිලධාරීන්ගෙන් සේවය ලබා ගනිමින් මෙම ආයතනයේ දෛනික රාජකාරි ඉටුකර ඇති බැවින් අඩුපාඩු බහුල වශයෙන් සිදුවී ඇති බව, මේ වන විට බොහොමයක් දුරට කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදුකර ඇති බව හා අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරිය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විධායක මට්ටමේ තනතුරු 08කට අදාළව පුරප්පාඩු 23 ක්ද, විධායක නොවන මට්ටමේ තනතුරු 06 කට අදාළව පුරප්පාඩු 65 ක්ද හා සුළු සේවක තනතුරු 04 කට අදාළව පුරප්පාඩු 16 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු 104 ක් පැවතුණි. අධිකාරිය පිහිටුවා වර්ෂ 04 ක් ඉක්මවා තිබුණද, එම පුරප්පාඩු සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 86 ක් ස්ථිරව පිරවීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. ඒ ඒ තනතුරු සඳහා දිරිගන්වන සුළු වැටුප් පරිමාණ සහ වෙනත් වරප්‍රසාද සහිතව බඳවා ගැනීමේ පටිපාටි කාලෝචිතව සංශෝධනය කර නොගැනීම ඊට හේතු වී තිබුණි. ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන, සායනික පරීක්ෂණ හා ඔසුසල් නියාමනය වැනි තාක්ෂණික කටයුතු නිවැරදිව ඉටුකර ගත නොහැකි වීමට හා එදිනෙදා පරිපාලන කටයුතු කෙරෙහිද මෙම කාර්ය මණ්ඩල ඌනතාවය බලපා තිබුණි. | මේ වන විට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරමින් සිටින බව හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කරගත් වහාම තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | අධිකාරියේ ක්‍රියාකාරීත්වය බාධාවකින් තොරව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු, අනුමත කාර්ය මණ්ඩලය තුළ විධිමත් ලෙස පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය නිලධාරී, අභ්‍යන්තර විගණක, ඖෂධ විශ්ලේෂක, පිරිවැය නිලධාරී, ඖෂධ පරීක්ෂක සහ ඖෂධවේදී යන තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර නොතිබුණි. | මේ වන විට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරමින් සිටින බව හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කරගත් වහාම තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර අනුමත කර ගත යුතුය. |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කඩිනම් කරමින් පවතින බව හා ඉදිරියේදී නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 14 ක් ඉටුකර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. | ඉදිරි ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා පසුවිපරම් පිළිබඳ වැඩි අවධානයක් යොමුකරන බව. | ක්‍රියාකාරී සැලැසුම්වලට අනුව කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය පරිදි ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කළ යුතුය. ඒ ඒ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම අදාළ නිලධාරීන් වෙත නිශ්චිතව පැවරිය යුතු අතර ඒ පිළිබඳව විධිමත් අධීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ආ) 2018 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. එසේම කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 27ක් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකිවිය. | -එම- | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව හා විධිමත්ව පිළියෙල කළ යුතුය. කාර්ය සාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව හා මැනිය හැකි මට්ටමින් දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂය තුළදී මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට සියයකින් සම්පූර්ණ කිරීමට ඉලක්ක කර තිබුණු රු. මිලියන 500 ක ප්‍රතිපාදන සහිත අධිකාරිය සඳහා වන ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යයයේ මූලික කටයුත්තක් වූ ඉඩම පවරා ගැනීමේ කටයුතු හෝ ආරම්භ කර නොතිබුණි. | අදාළ කටයුතු දැනටමත් සිදුකරමින් පවතින බව. | සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර ගත හැකි ක්‍රියාකාරකම් හෝ ඉන් කොටසක් පමණක් ඇතුළත් කරමින් ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ඖෂධ,වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ලියාපදිංචි කර ඇති හා බලපත්‍ර ලබා දී ඇති ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල තත්ත්වය හා ආරක්ෂාව පිළිබඳ පශ්චාත් අලෙවි සමීක්ෂණ පැවැත්වීම වැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ ඉලක්කගත ක්‍රියාකාරකම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වාදී ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරන බව. | පනතේ දැක්වෙන අරමුණු ඉටුකරගත හැකි පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

## 3.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"හා 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, අධිකාරිය විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | අධිකාරිය තිරසාර සංවර්ධන අරමුණු ලෙස ප්‍රධාන වශයෙන් දේශීය ඖෂධ නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා අවශ්‍ය මානයන් පිළිබඳ අවධානය යොමුකර ඇත. මේ පිළිබඳ තවදුරටත් විශ්ලේෂණාත්මකව අවධානය යොමුකර අවශ්‍ය කටයුතු කරන බව. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |